## දරිද්‍රතාවයේ විවිධ ක්ෂේත්‍ර විමසා බැලීම සඳහා වන මාධ්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහන

දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව වෘත්තීය සේවාවන් සපයන ස්වාධීන පර්යේෂණ සංවිධානයක් වන දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් දරිද්‍රතාවය සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳව පිරිනමන අධිශිෂ්‍යත්ව වැඩසටහනක් සඳහා පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි සහ වෙබ් මාධ්‍යවේදීන්ගෙන් ( නිදහස් මාධ්‍යවේදීන්ද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ.

තරඟකාරී පදනමක් යටතේ තෝරාගන්නා මාධ්‍යවේදීන් 15 දෙනෙකු සඳහා දරිද්‍රතාවයේ විවිධ ස්වරූප පිළිබඳ අවබෝධයක් ලබා දීමත්, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සම්බන්ධයෙන් අනාවරණය නොවුණු සහ වාර්තා නොවුණු අංශ හඳුනා ගැනීම සඳහා උපදෙස් ලබා දීමේ අරමුණින් මෙම අධිශිෂ්‍යත්ව වැඩසටහන සැලසුම් කොට තිබේ.

අධිශිෂ්‍යත්වලාභීන්ට මාධ්‍යවේදීන් සහ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂකයන් සමග සෘජුව කටයුතු කිරීමට අවස්ථාව ලැබෙන අතර ක්ෂේත්‍ර චාරිකා වෙනුවෙන් දීමනාවක් ද ලබාදේ. තමන් තෝරාගන්නා මාතෘකාවක් යටතේ ගැඹුරින් අධ්‍යනය කිරීමට ඔවුන්ට සිදුවන අතර එම ගවේෂණාත්මක වාර්තාව තමන් සේවය කරන මාධ්‍ය ආයතනයේ ප්‍රචාරය කිරීම සඳහා එකඟ විය යුතුය.

වැඩසටහන සඳහා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම කටයුතු කරන ප්‍රවෘත්ති වාර්තාකරුවන්, විශේෂාංග ලේඛකයන්, විද්‍යුත් මාධ්‍ය නිෂ්පාදකයන් හා අන්තර්ජාල මාධ්‍යවේදීන් සමබර පදනමක් යටතේ තෝරා ගැනීම සිදු කෙරේ.

අවම වශයෙන් වසර පහක කාලයක් මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපිරු මාධ්‍යවේදීන්ගෙන් (ඡායාරූප ජනමාධ්‍යවේදීන් ද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම වැඩසටහන සඳහා පූර්ණකාලීන, අර්ධ කාලීන සහ නිදහස් මාධ්‍යවේදීන්ට අයදුම් කළ හැකි අතර තමන් විසින් වැඩසටහනේ දී සම්පාදනය කරනු ලබන ගවේෂණාත්මක ලේඛනය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන ස්වකීය මාධ්‍ය ආයතනයේ පළ කිරීම සඳහා සංස්කාරකවරයා හෝ නිෂ්පාදකයා විසින් අනුමැතිය ලබාදුන් බවට ලිපියක් අයදුම්පත සමග එවිය යුතුය.

ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සහ වැඩසටහන පුරාවට ඔවුන්ට මග පෙන්වීම සිදු කරනු ලබන්නේ පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි සහ වෙබ් මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපිරි පංච පුද්ගල විශේෂඥ මණ්ඩලයක් විසිනි. තෝරා ගන්නා ලද මාධ්‍යවේදීන් සඳහා එක් දින අනුගත කිරීමේ (orientation) වැඩසටහනක් පැවැත්වෙන අතර එහිදී ඔවුන්ට දරිද්‍රතාවයේ විවිධ ස්වරූප අවබෝධ කරගැනීම සහ මහජනයාට වැදගත්වන දිළිඳුකම ආශ්‍රිත කරුණු වාර්තාකරණයේදී ස්වකීය මාධ්‍ය කුසලතා භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දේ.

අනුගතකිරීමේ වැඩසටහනෙන් පසුව තම වාර්තාව මගින් ආවරණය කිරීමට බලාපොරොත්තු වන දරිද්‍රතාවයට අදාළ තේමාව පිළිබඳව මූලික දැනුවත් කිරීමක් අධිශිෂ්‍යත්ව ලාභීන් විසින් සිදු කළ යුතුය. තමන් විසින් මුලින් එකඟ වූ වාර්තා ප්‍රමාණය ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ට මාස හතරක කාලයක් ලබාදේ. එම කාලය අතරතුර විශේෂඥ මණ්ඩලය විසින් ශිෂ්‍යත්වලාභීන්ට මග පෙන්වීම සිදු කරනු ලබයි. ව්‍යාපෘතිය අවසානයේ ඉදිරිපත් කෙරෙන වාර්තා ශිෂ්‍යත්වලාභීන්ගේ මාධ්‍ය ආයතනවල සහ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ වෙබ් අඩවියේ පළ කෙරෙනු ලැබේ (http://www.cepa.lk/ ).

දරිද්‍රතාවය සහ සංවර්ධනය පිළිබඳ මාධ්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහන

**අයදුම් කිරීමේ අවසාන දිනය, 2016, අගෝස්තු මස 26**

**මෙම අධිශිෂ්‍යත්ව කුමකට ද ?**

මෑතකදී ශ්‍රී ලංකාව මධ්‍යම ප්‍රමාණයේ අදායම් ලබන රටක් ලෙස හදුනා ගැනිණි. ඒක පුද්ගල ආදායමේ කොටසක් ලෙස සමාජ අංශ වෙනුවෙන් රාජ්‍ය වියදම් අඩුවීම නිසා අසමානතාවයන් වර්ධනය වී තිබේ. එම නිසා ජනතාවගේ ශක්‍යතාවයන්, පුද්ගල සහ සමාජ වත්කම්, විවේකය ඇති හෝ නැති බව, සමාජ සහභාගීත්වය හා ආරක්ෂාව යන කරුණු පිළිබඳව සාකල්‍යාත්මක දෘෂ්ටියකින් දරිද්‍රතාවය පිළිබඳව අවබෝධය ලබා ගත යුතුය.

කෙසේ වෙතත්, බොහෝ මාධ්‍ය දුප්පත්කම දකින්නේ මුදල් අගහිඟකම මත පදනම්වන ආර්ථිකමය දෘෂ්ටියකිනි. දරිද්‍රතාවය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගැනීමේ දී ජනතාවට සිය සම්පූර්ණ ශක්‍යතාවයන් අත්පත්කර ගැනීමට ඉවහල් වන ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, නීතියේ ආධිපත්‍යය, අදහස් ප්‍රකාශනයේ හා මාධ්‍ය නිදහස යන කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ. දරිද්‍රතාවය පිළිබඳව සීමිත අවබෝධයට අමතරව බොහෝ මාධ්‍යයන් එම ක්ෂේත්‍රයට අදාළ ගවේෂණාත්මක ජනමාධ්‍ය පැවරුම් සඳහා වෙන්කරනු ලබන්නේ ඉතා අවම මුදලක් වන අතර සමහර මාධ්‍ය ආයතන ඒ සඳහා සිය අයවැයෙන් මුදල් වෙන් නොකරන තරම්ය.

අධිශිෂ්‍යත්ව වැඩසටහන

මෙම මාධ්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහන මගින් ඉහත සඳහන් කළ ගැටලුවට කිසියම් සාධනීය ප්‍රවේශයක් ලබාගැනීමට දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය බලාපොරොත්තු වේ.

තරඟකාරී පදනමක් යටතේ තෝරාගන්නා මාධ්‍යවේදීන් 15 දෙනෙකු සඳහා දරිද්‍රතාවයේ විවිධ ස්වරූප පිළිබඳ අවබෝධයක් ලබා දීමත්, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සම්බන්ධයෙන් අනාවරණය නොවුණු සහ වාර්තා නොවුණු අංශ හඳුනා ගැනීම සඳහා උපදෙස් ලබා දීම සඳහා මෙම අධිශිෂ්‍යත්ව වැඩසටහන සැලසුම් කොට තිබේ.

අධිශිෂ්‍යත්වලාභීන්ට ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් සහ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂකයන් සමඟ සෘජුව කටයුතු කිරීමට අවස්ථාව ලැබෙන අතර ක්ෂේත්‍ර චාරිකා වෙනුවෙන් දීමනාවක් ද ලබාදේ. තමන් තෝරාගන්නා මාතෘකාවක් යටතේ ගැඹුරින් අධ්‍යනය කිරීමට ඔවුන්ට සිදුවන අතර එම ගවේෂණාත්මක වාර්තාව තමන් සේවය කරන මාධ්‍ය ආයතනයේ ප්‍රචාරය කිරීම සඳහා එකඟ විය යුතුය.

අයදුම්කිරීමට උපදෙස්

මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් මාධ්‍යකරුවන්ට ( නිදහස් මාධ්‍යවේදීන් ද ඇතුළුව) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ විවිධ ස්වරූපයන් ගවේෂණාත්මකව වාර්තාකරණය සඳහා වන අධිශිෂ්‍යත්ව වැඩසටහනට අයදුම් කළ හැකිය.

- අයදුම්කරුවන් ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රවෘත්ති වාර්තාකරුවන්, විශේෂාංග ලේඛකයන්, විද්‍යුත් මාධ්‍ය නිෂ්පාදකයන් හෝ අන්තර්ජාල මාධ්‍යවේදීන් විය යුතුය ( පුවත්පත්, සඟරා, ගුවන් විදුලි, රූපවාහිනී, පුවත් වෙබ් අඩවි).
- විදේශීය වාර්තාකරුවන්, බ්ලොග්කරුවන් හා පුවත්පත්වලට සිය මත සපයන ලේඛකයන් මෙම වැඩසටහනට සුදුසුකම් නොලබයි.

- අයදුම්කරුවන් පූර්ණකාලීන, අර්ධ කාලීන සහ නිදහස් මාධ්‍යවේදීන් විය යුතු අතර අවම වශයෙන් වසර පහක කාලයක් මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපුරා තිබිය යුතුය. උදාහරණයක් ලෙස 2011 වසරේ සිට මාධ්‍ය ආයතනයක් සමග වෘත්තීමය වශයෙන් කටයුතු කර තිබිය යුතුය.
- නිදහස් මාධ්‍යවේදීන්ට තමන් දායකත්වය සපයන පිළිගත් මාධ්‍ය ආයතනයක් සමග කටයුතු කර තිබිය යුතු වන අතර ඔවුන් ද අදාළ ආයතනයේ සංස්කාරකවරයාගෙන් ලබා ගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ( වැඩි විස්තර පහත දැක්වේ).
- අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.
- අයදුම්කරුවන් සඳහා වයස් සීමාවක් නොමැති අතර සිය වෘත්තිය ජීවිතයේ මධ්‍යම අවධියේ කටයුතු කරන වසර 5 ක් හෝ ඊට වඩා අත්දැකීම් ඇති මාධ්‍යවේදීන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.
- ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම අයදුම්පත් යොමු කළ හැකිය.

අයදුම්පතේ අඩංගු විය යුතු දෑ

- ඔබව නිර්දේශ කළ හැකි දෙදෙනෙකුගේ විස්තර සහිත ජීව දත්ත සටහනේ මෘදු පිටපතක්
- තමන් මෙම වැඩසටහනට අයදුම් කිරීමට පෙළඹ වූ කරුණු අඩංගු වන වචන 250කට නොවැඩි ලිපියක්
- මහජන වැදගත්කමකින් යුතු සිද්ධියක් පිළිබඳව ඔබ විසින් පළ කරන ලද පුවත්පත් /වෙබ් ලිපි, විද්‍යුත් මාධ්‍ය වැඩසහන් අවම වශයෙන් 3ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්. ගුවන් විදුලි හා රූපවාහිනී අන්තර්ගතයන් CD පටයක හෝ අන්තර්ජාලයෙන් ලබා ගත හැකිනම් ඊට අදාළ වෙබ් ලිපිනය එවිය යුතුය.
- තමන් විසින් වැඩසටහනේ දී සම්පාදනය කරනු ලබන ගවේෂණාත්මක ලේඛනය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන ස්වකීය මාධ්‍ය ආයතනයේ පළ කිරීම හෝ ප්‍රචාරකය කිරීම සඳහා සංස්කරකවරයා විසින් අනුමැතිය ලබාදුන් බවට ලිපියක් අයදුම්පත සමග එවිය යුතුය. එම ලිපිය මාධ්‍ය ආයතනයේ ලිපි ශීර්ෂයක අඩංගු විය යුතු අතර ඊට අත්සන් යොදා තිබිය යුතුය. (ස්කෑන් කරන ලද ලිපි පිළි ගැනේ).

අසම්පූර්ණ අයදුම්පත් භාර නොගැනේ.

අයදුම්පත් එවිය හැකි අවසාන දිනය 2016, අගෝස්තු මස 26 ශ්‍රී ලංකාවේ වේලාවෙන් පස් වරු 6.00 ට පෙර. සියලු අයදුම්පත් අවසාන දිනයට පෙර CEPA ආයතනය වෙත ලැබී තිබිය යුතුය.

තැපැල් මාර්ගයෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් අයදුම්පත් එවිය හැකිය.

තැපැල් ලිපිනය - දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, අංක 29, ආර් ජී සේනානායක මාවත ( පැරණි - ග්‍රෙගරි මාවත ) කොළඹ 7.

දරිද්‍රතාවය සහ සංවර්ධනය පිළිබඳ මාධ්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහනේ ඊමේල් ලිපිනය mediafellowship@cepa.lk

තෝරාගැනීමේ ක්‍රමවේදය

- පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි සහ වෙබ් මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපිරි පංච පුද්ගල විශේෂඥ මණ්ඩලයක් විසින් වැඩසටහන පුරාවට අධිශිෂ්‍යත්වලාභීන්ට මග පෙන්වීම සිදු කරයි.

විශේෂඥ මණ්ඩලය

1. නාලක ගුණවර්ධන
2. කුසල් පෙරේරා
3. හැනා ඊබ්‍රහිම්
4. ශමින්ද්‍ර කුලමාන්නගේ
5. අරුන් අරෝකියනාදන්

අධිශිෂ්‍යත්ව ක්‍රියාකාරකම්

- අනුගත කිරීමේ (orientation) වැඩසටහනින් පසුව උපදේශන කටයුතු ඇරඹෙන අතර දරිද්‍රතාවයේ විවිධ ස්වරූප අවබෝධ කරගැනීම සහ මහජනයාට වැදගත් වන දිළිඳුකම ආශ්‍රිත කරුණු වාර්තාකරණයේදී ස්වකීය මාධ්‍ය කුසලතා භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදේ.

- තම ගවේෂණාත්මක ලේඛනය මගින් ආවරණය කිරීමට බලාපොරොත්තු වන දරිද්‍රතාවයට අදාළ තේමාව (orientation) වැඩසටහනින් පසුව ඉදිරිපත් කල යුතුය. එමෙන්ම එහිදී ක්ෂේත්‍ර චාරිකා, සම්මුඛ සාකච්ඡා හා අනෙකුත් ක්‍රම මගින් සිය තේමාව ආවරණය කරන අයුරු සඳහන් කල යුතුය.

- CEPA ආයතනයේ පර්යේෂණ ආවරණය කිරීමට අධිශිෂ්‍යත්වලාභීන්ගෙන් කිසිසේත් බලාපොරොත්තු නොවේ. එහෙත් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා CEPA පර්යේෂකයන්ගේ සහයෝගය ලබාගත හැකි අතර ආයතනයේ පුස්තකාලය ද භාවිතා කල හැකිය.

- තමන් මුලින් එකඟ වූ වාර්තා ප්‍රමාණයට අදාල පැවරුම් කටයුතු කරගෙන යාමටත් ඒවා අවසන් කොට ඉදිරිපත් කිරීමට මාස හතරක කාලයක් හිමිවේ. එහිදී විශේෂඥ මණ්ඩලය විසින් අධිශිෂ්‍යත්වලාභීන්ට මග පෙන්වීම සිදු කරනු ලැබේ.

- වැඩසටහන අවසානයේ ඉදිරිපත් කෙරෙන මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වාර්තා සිය මාධ්‍ය ආයතනයන්හි 2016 දෙසැම්බර් හා 2017 ජනවාරි අතර කාලය තුල ප්‍රචාරය විය යුතුය.

- අදාළ මාධ්‍යයන්ගේ පළවීමෙන් පසුව අදාළ අන්තර්ගතයන් CEPA වෙබ් අඩවියේ පල කෙරේ. http://www.cepa.lk (http://www.cepa.lk/events/section/media-fellowship-program.html).

- අධිශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කිරීමේදී සියලුම මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන වැඩසටන අවසානයේ ඉදිරිපත්වන ලිපි හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වල ප්‍රකාශන හිමිකම CEPA ආයතනය වෙත ලබා දීමට එකඟ විය යුතුය. එහිදී ලේඛකයන්ගේ හා නිෂ්පාදකවරුන්ගේ බුද්ධිමය හිමිකම් සම්පූර්ණයෙන්ම පිළිගනු ලැබේ.

- අධිශිෂ්‍යත්ව වැඩසටහන අවසානයේ සම්පාදනය වන ලේඛන සඳහා ප්‍රකාශන හිමිකම් රාමුව වන්නේ the Creative Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) license http://creativecommons.org/licenses/by-sa/3.0/igo/

මෙම ව්‍යාපෘතිය යුනෙස්කෝ සංවිධානයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක වේ